# දෘෂ්ටිවාදය පිළිබඳ කෙටි සටහනක්

දෘෂ්ටිවාදය යනු කුමක් ද? එය වටහා ගැනීම සඳහා අපි මුලින් ම දෘෂ්ටිවාදය පිළිබඳ ඉතිහාසය සැකෙවින් විමසා බලමු. ඒ පිළිබඳ ව විවිධ චින්තකයින් විවිධ අදහස් ඉදිරිපත් කර ඇත. ටෙරී ඊගල්ටන් දෘෂ්ටිවාදය පිළිබඳ පළ වී ඇති විවිධ මත රැසක් ඉදිරිපත් කර ඇත. ඒවායින් කිහිපයක් නම්, දෘෂ්ටිවාදය යනු,

1. සමාජ ජීවිතයේ අර්ථ සංඥා හා වටිනාකම් නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය
2. විශේෂ වූ සමාජ කණ්ඩායමක් හෝ පන්තියකට ආවේණික වූ අදහස් පද්ධතිය
3. අධිපති දේශපාලන බලය සුජාත කිරීමට උපකාරී කරනු ලබන අදහස්
4. අධිපති දේශපාලන බලය සුජාත කිරීමට උපකාරී කරනු ලබන ව්‍යාජ අදහස්
5. විෂයයට (subject) තත්ත්වයක් සපයන යමක්
6. සමාජ ම ය වශයෙන් අවශ්‍ය මායාව
7. කතිකාව හා බලය සම්බන්ධ වීම
8. සමාජ ජීවිතය ස්වාභාවික යථාර්ථය බවට පත් කරන ක්‍රියාවලිය

දෘෂ්ටිවාදය පිළිබඳ මෙම අර්ථ දැක්වීම් ඇතැම් විට ආසන්න ලෙස එකිනෙකට අනුරූපී වන අතර ඇතැම් විට එකිනෙකට අනුරූපී ද නො වේ. එමෙන් ම දෘෂ්ටිවාදය ඇතැම් විටෙක මායාවක් ලෙසත් තවත් විටෙක භෞතික ක්‍රියාවලියක් ලෙසත් අර්ථ දැක්වෙන අයුරු පෙනේ. තව ද එය සවිඥානක ක්‍රියාවලියක් ලෙස එක් මතයකින් කියවෙන විට තවත් මතයකින් එය අවිඥානක ක්‍රියාවලියක් ලෙස හැඟවෙයි. විටෙක එය දැනුමට (ඥානවිභාගයට) සම්බන්ධ ගැටලුවක් වන විට තවත් විටෙක එය සද්භාවාත්මක ගැටලුවක් බවට පත් වේ. දෘෂ්ටිවාදය පිළිබඳ මෙවැනි විවිධ මත පළ වීමට හේතුව වන්නේ විවිධ දෘෂ්ටිකෝණ මඟින් එය අර්ථකථනය කිරීමට යාමට වඩා ideology නමැති ඉංග්‍රීසි වචනයෙහි “ology“ යන කොටසෙහි අර්ථය අපගමනය වීම බව ඊගල්ටන් සඳහන් කරයි. එමඟින් අදහස් වන්නේ යම් ප්‍රපංචයක් පිළිබඳ විද්‍යාව හෝ ඒ පිළිබඳ කරනු ලබන අධ්‍යයනය වන නමුත් මෙම “ology“ පදය අපගමනය වීමෙන් හැදෑරීමෙන් ලබා ගනු ලබන ක්‍රමානුකූල දැනුම වෙනුවට එය අර්ථයකට ලඝු වේ.

දෘෂ්ටිවාදය යන පදයේ ඉතිහාසය විමසීමේ දී දැනට ලැබී තිබෙන සාක්ෂ්‍ය අනුව එය ප්‍රංශයේ ඩෙස්ටුට් ඩී ට්‍රේසි විසින් හඳුන්වා දුන් පදයක් ලෙස සැලකිය හැකි ය. eidos නමැති ග්‍රීක වචනය “දෘශ්‍ය රූපය“ නමැති අරුතින් ගෙන ඔහු ideology නමැති වචනය නිපදවා ඇත. ඔහුට අනුව දෘෂ්ටිවාදය යනු මානව අදහස් පිළිබඳ විද්‍යාත්මක හැදෑරීම ය. නමුත් පසු කාලීන ව දෘෂ්ටිවාදය යනු අදහස් පද්ධතියක් යැයි විග්‍රහ කෙරී ඇත. ඩී ට්‍රේසිට අනුව දෘෂ්ටිවාදය යනු මානව සත්වයා පිළිබඳ විද්‍යාවේ කොටසකි. එමඟින් ඔහු අදහස් මූලික කොටස්වලට විච්ඡේදනය කිරීම අරමුණු කරයි. ඩී ට්‍රේසිගේ මෙම මැදිහත් වීම එතෙක් පූජකයින්ගේ හා පාලකයින්ගේ මිථ්‍යාදෘෂ්ටික අදහස්වලට එරෙහි විද්‍යාත්මක නැඟී සිටීමක්

ලෙස හඳුන්වයි. ඒ අනුව පාලකයින් හා පූජකයින් සතු ව පැවති දැනුම පිළිබඳ ඒකාධිපතිත්වය ප්‍රභූ හා විද්‍යාත්මක න්‍යායාචාර්යවරුන් අතට පත් විය. නමුත් පසුකාලීන ව නැපෝලියන් බොනපාට්ගේ අදහස් නිසා නැවතත් ආගම පාලනයට අත්‍යවශ්‍ය කොටසක් බවට පත් විය. එහි දී ඩී ට්‍රේසිගේ දෘෂ්ටිවාදය පිළිබඳ අදහස් යළිත් ගර්හාවට ලක් විය.

දෘෂ්ටිවාදය පිළිබඳ සංකල්පය ලාංකේය දේශපාලනය හා කලා කෘති සම්බන්ධයෙන් තවමත් භාවිතා වන්නේ මාක්සියානු අර්ථයකිනි. එබැවින් කාල් මාක්ස් දෘෂ්ටිවාදය පිළිබඳ පළ කර ඇති අදහස් මී ළඟට සලකා බලමු.

අදහස්, සංකල්ප හා සවිඥානකත්වය නිෂ්පාදනයවීම මිනිසුන්ගේ භෞතික ක්‍රියාවලිය හෙවත් සැබෑ ජීවිතය සමඟ සම්බන්ධ බව ඔහු පෙන්වා දෙයි. මෙම අදහස්වල නිර්මාතෘවරුන් වන්නේ මිනිසුන් ම ය. මේ සඳහා නිෂ්පාදන බලවේගවල වර්ධනය බලපාන බව ඔහු වැඩිදුරටත් පෙන්වා දෙයි. මාක්ස්ට අනුව ඇතැම් සමාජ තත්ත්ව තුළ මානව බලය නිෂ්පාදනය හා ක්‍රියාවලි මිනිසුන්ගේ පාලනයෙන් වියුක්ත ව ස්වායත්ත පැවැත්මක් අත් කර ගනියි. එමඟින් මිනිසා තමන්ගේ නිෂ්පාදනය පිළිබඳ පරාරෝපිත අදහස් ඇති කර ගන්නා බවත් මෙම පරාරෝපණය නම් අදහස භාණ්ඩ මඟින් මිනිසා මෙහෙයවන බවට වන අදහස සමඟ ද සම්බන්ධ කරන ආකාරයක් ද දැකිය හැකි ය. මෙම ක්‍රියාවලිය පිළිබඳ ව සරළ ව සඳහන් කරන්නේ නම් මාක්ස් සඳහන් කරන්නේ භෞතික තත්ත්ව මත සවිඥානකත්වය තීරණය වන බව ය. සෑම යුගයක දී ම පාලක පන්තියේ අදහස් පාලක අදහස් බවට පත් වන බවත් මාක්ස් සහ එංගල්ස් පෙන්වා දෙති. සමාජයේ භෞතික බලවේග පාලනය කරන පන්තිය ම පාලක බුද්ධි ම ය බලවේගය බවට පත් වන බව ඔවුහු ඉන් අනාවරණය කරති. දෘෂ්ටිවාදය සමඟ ව්‍යාජ විඥානය නමැති අදහස සම්බන්ධ කරන්නේ ෆ්‍රෙඩ්රික් එංගල්ස් ය. එහි දී පුද්ගලයින්ට බලපාන සැබෑ තත්ත්ව සඟවාලීම සඳහා ඔහු තුළ ව්‍යාජ විඥානයක් ගොඩනඟන බව අදහස් වේ.

දෘෂ්ටිවාදය නමැති සංකල්පය අධ්‍යයනය කරන විට තවත් වැදගත් දාර්ශනිකයෙකු වන්නේ ලුවී අල්තුෂර් ය. දෘෂ්ටිවාදය හා දෘෂ්ටිවාදී රාජ්‍ය උපකරණ නමැති සංකල්ප හඳුන්වා දුන් තැනැත්තා ඔහු ය. ඒ සඳහා මනෝවිශ්ලේෂණය ද ඔහු උපයෝගී කර ගනියි. දෘෂ්ටිවාදය මඟින් ක්‍රියාකාරී වීමේ දී ඒ තුළ පවතින අවිඥානක ස්වරූපය පෙන්වා දෙන්නට ඔහු උත්සාහ දැරී ය. අල්තුෂර්ට අනුව රාජ්‍යය යනු මර්දනකාරී උපකරණයක් වන අතර එමඟින් පාලක පන්තියට වැඩ කරන පන්තිය මත ආධිපත්‍යය පැතිරවීමට අවස්ථාව ලබා දෙයි. ඔහු රාජ්‍යයට අදාළ මර්දනකාරී උපකරණ (රජය, පරිපාලනය, හමුදාව, පොලීසිය, අධිකරණය, බන්ධනාගාර ආදිය) හා දෘෂ්ටිවාදී රාජ්‍ය උපකරණ පවතින බව පෙන්වා දෙයි. දෘෂ්ටිවාදී රාජ්‍ය උපකරණ ඔහු පහත පරිදි වර්ගීකරණය කරයි. එනම්, ආගමික දෘෂ්ටිවාදී රාජ්‍ය උපකරණ, අධ්‍යාපන දෘෂ්ටිවාදී රාජ්‍ය උපකරණ, පවුල් දෘෂ්ටිවාදී රාජ්‍ය උපකරණ, නෛතික දෘෂ්ටිවාදී රාජ්‍ය උපකරණ, දේශපාලන දෘෂ්ටිවාදී රාජ්‍ය උපකරණ, වෘත්තීය සමිති දෘෂ්ටිවාදී රාජ්‍ය උපකරණ, සන්නිවේදන දෘෂ්ටිවාදී රාජ්‍ය උපකරණ හා සංස්කෘතික දෘෂ්ටිවාදී රාජ්‍ය උපකරණ

වේ.

ඔහු සඳහන් කරන්නේ මර්දනකාරී රාජ්‍ය උපකරණ ප්‍රමුඛ ව මර්දනකාරී ලෙස ක්‍රියාකාරී වන බවත් ද්විතියික ව එය දෘෂ්ටිවාදය මඟින් ක්‍රියාකාරී වන බවත් ය. ඒ ආකාරයෙන් දෘෂ්ටිවාදී රාජ්‍ය උපකරණ ප්‍රමුඛ ව ම දෘෂ්ටිවාදය මඟින් ක්‍රියාකාරී වන අතර ද්විතියික ව එය මර්දනය මඟින් ක්‍රියාකාරී වේ. ඔහු වැඩි දුරටත් සඳහන් කරන්නේ මෙම දෘෂ්ටිවාදය පුද්ගලයින්ගේ පරිකල්පනයට සම්බන්ධ වන බවත් ඒවා යථාර්ථයට අනුරූපී නො වන බවත් ය. එය ඔහු ගොඩනගන පළමු තිසීසය යි. ඔහුට අනුව දෙවියන් යනු සැබෑ රජුගේ පරිකල්පනීය නිරූපණයකි. ඔහු ගොඩනගන දෙවන තිසීසය නම් දෘෂ්ටිවාදයට භෞතික පැවැත්මක් ද පවතියි යන්න ය. එම තිසීස දෙක මඟින් ඔහු පෙන්වා දෙන්නේ දෘෂ්ටිවාදයේ සැබෑ සබඳතා පරිකල්පන සබඳතා වන නමුත් එම පරිකල්පනීය සබඳතා භෞතික පැවැත්ම තහවුරු කරන බව ය.

දෘෂ්ටිවාදය පැහැදිලි කිරීමේ දී ඔහු භාවිතා කරන තවත් අදහසක් වන්නේ පොලාපැනීම (interpellation) යන්න ය. ඔහු සඳහන් කරන්නේ දෘෂ්ටිවාදය මඟින් පුද්ගලයන් විෂයයක් බවට පොලාපන්නන බව යි. ඒ සඳහා ඔහු යොදා ගනු ලබන උදාහරණය වන්නේ පොලිස් නිලධාරියෙකුගේ ක්‍රියාවකි. පොලිස් නිලධාරියෙකු යම් පුද්ගලයකුට හඬ නගා අමතන විට එම පුද්ගලයා හැරී බලන්නේ යයි උපකල්පනය කරමු යැයි ඔහු යෝජනා කරයි. අංශක 180 ක් හැරී බලන විට ඔහු විෂයයක් බවට පත් වන බව අල්තුෂර් පෙන්වා දෙයි. එය සිදු වන්නේ එම ආමන්ත්‍රණය තමන් වෙනුවෙන් සිදු කරන ලද්දක් බව එම පුද්ගලයා හඳුනා ගන්නා නිසා බව අල්තුෂර් වැඩි දුරටත් සඳහන් කරයි. පොලිස් නිලධාරියෙකු මෙසේ ආමන්ත්‍රණය කරන විට අවස්ථා දහයෙන් නමයක දී ම නිවැරදි පුද්ගලයා හැරී බලන බව ඔහු ප්‍රකාශ කරයි. එහි දී එම පුද්ගලයා විශ්වාස කරන්නේ, සැක කරන්නේ ඔහු වෙනුවෙන් එම ආමන්ත්‍රණය සිදු කළ බව ය. දෘෂ්ටිවාදයට අනුකූල විෂයයන් හොඳ විෂයයන් බවටත් ඊට එරෙහි වන විෂයයන් නරක විෂයයන් බවටත් පත් වන අතර නරක විෂයය මර්දනකාරී රාජ්‍ය උපකරණ සඳහා ඉඩ විවර කරන බවත් ඔහු පෙන්වා දෙයි. සැබැවින් ම දෘෂ්ටිවාදය යනු වැරදි හඳුනා ගැනීමක් බවත් ඔහු වැඩිදුරටත් සඳහන් කරයි.

අන්තෝනියෝ ග්‍රාම්ස්චිගේ දෘෂ්ටිවාදය පිළිබඳ අදහස මඟින් ද අල්තුෂර් මෙන් දෘෂ්ටිවාදය අභ්‍යන්තරීකරණය කිරීමක් අදහස් වන අතර ඔහු හඳුන්වා දුන් හෙජමොනිය නමැති අදහසට තවමත් වලංගුභාවයක් පවතියි. ඒ අනුව ග්‍රාම්ස්චි ඇසුරින් දෘෂ්ටිවාදය විශ්ලේෂණය කිරීම අයත් වන්නේ ඥානවිභාගයට ය. ජාතිවාදය න්‍යාය ගත කිරීමට ඔහු අසමත් වන්නේ ඒ නිසා ය. එනම්, මිනිසෙක් ෆැසිස්ට්වාදී වන්නේ ඇයි ද යන්න න්‍යාය ගත කිරීමට ඔහු අසමත් විය. එය වෙනත් ආකාරයකින් සඳහන් කරන්නේ නම් ෆැසිස්ට්වාදියා සෑම විට ම යථාර්ථය සමඟ පරතරයක් පවත්වා ගැනීම ඔහුගේ දැනුමට විෂය නො විණ. නමුත් කොමියුනිස්ට්වාදය තුළ මෙම පරතරය නො පවතියි. මන්ද යත් එහි දී මිනිසුන් විශ්වාසය තබන්නේ ක්‍රියාකාරීවීම පිළිබඳව ය.

දෘෂ්ටිවාදය පිළිබඳ ස්ලෝවීනියානු පාසැල මඟින් පළ කර ඇති අදහස් මීළඟට අපි සලකා බලමු. අල්තුෂර් පොලාපැනීම මඟින් දෘෂ්ටිවාදය අභ්‍යාන්තරීකරණය කිරීමක් ලෙස සලකන විට ස්ලෝවීනියානු පාසැල දෘෂ්ටිවාදය යනු බහිෂ්කරණයක් ලෙස සලකයි. එනම්, දෘෂ්ටිවාදය අභ්‍යාන්තරීකරණය අසමත් වන විට මනෝවිශ්ලේෂණ ආත්මය බිහි වේ. ආත්මය තමන්ගේ විනෝදයෙන් ගැලවීම සඳහා දෘෂ්ටිවාදී අදහස් පද්ධතිය වැළඳ ගනියි. ආත්මය යථාර්ථය සමඟ පරතරයක් පවත්වා ගන්නේ ඒ ආකාරයට ය. මාටින් හෛඩගර් ඇතුළු සත්තාව පිළිබඳ සද්භාවවේදී අදහස් පළ කරන දාර්ශනිකයන්ට පටහැනි ව මනෝවිශ්ලේෂණය පාදක කර ගන්නා දාර්ශනිකයින් වෙනස් වන්නේ මනෝවිශ්ලේෂණයේ අද්විතීය සොයා ගැනීම වන අවිඥානය නිසා ය. අවිඥානය ආචාරධාර්මික ය. එම ආචාරධාර්මිකබව නිසා ආත්මය ‘‘මම‘‘ යන ආස්ථානයෙන් ‘‘මා නො වෙයි‘‘ යන ආස්ථානයට මාරු වේ. ඒ අනුව සෑම විට ම පරතරයක් පවත්වා ගන්නා ආත්මයක් බිහි වේ. එමඟින් යටත් වැසියෙක් වෙනුවට සිතන කෙනෙක් බිහි වේ.

ස්ලෝවීනියානු පාසැලේ ප්‍රධාන දාර්ශනිකයෙක් වන්නේ ස්ලැවෝ ජිජැක් ය. ජිජැක්ට අනුව දෘෂ්ටිවාදයේ මූලික මානය යනු ව්‍යාජ විඥානයක් හෝ යථාර්ථය පිළිබඳ මායා ම ය නිරූපණයක් නො වේ. දෘෂ්ටිවාදී ලෙස හැඟවීමට ඇති යථාර්ථය ම දෘෂ්ටිවාදය යැයි ඔහු සඳහන් කරයි. ‘‘ඔවුන් නො දැන එය ම කරමින් සිටියි‘‘ යන මාක්සියානු අදහස ජිජැක් වර්ධනය කරමින් ‘‘ඔවුන් දැන දැන ම එය ම කරමින් සිටියි‘‘ යන්න පීටර් ස්ලොටර්ජික් ප්‍රකාශ කරන නරුමවාදී හේතුව සමඟ සම්බන්ධ කරයි. එනම්, මිනිසුන් ක්‍රියාකාරී වන්නේ දැනුවත් ව ය. එවිට දෘෂ්ටිවාදයට අදාළ මායාව දැනුම පැත්තේ තිබෙන්නෙක් නො ව පුද්ගලයින් ක්‍රියාකාරී වන යථාර්ථය පැත්තේ තිබෙන්නක් බව ඔහු පහදයි.

ජිජැක්ට අනුව දෘෂ්ටිවාදය අපට යථාර්ථයෙන් පලා යාමට අවස්ථාවක් උදා කර නො දෙන බවත්, ක්ෂති ම ය යමකින් පළා යාමක් ලෙස අප අපට සමාජ යථාර්ථය ඉදිරිපත් කරයි. දෘෂ්ටිවාදයේ ඉතිහාසය අනුව ඔහු එය කොටස් 3කට වර්ගීකරණය කරනු ලබයි. එනම්, දෘෂ්ටිවාදය දහමක් (doctrine) ලෙස, විශ්වාසයක් (belief) ලෙස හා පිළිවෙතක්/දෛනික හුරුපුරුදු (ritual) ලෙස ය. දෘෂ්ටිවාදය දහමක් යනුවෙන් අදහස් වන්නේ දෘෂ්ටිවාදය පිළිබඳ අදහස්, න්‍යාය හා විශ්වාස යි. දෘෂ්ටිවාදය පිළිබඳ විශ්වාසය ඉහත සඳහන් දහමෙහි බාහිර ප්‍රකාශමානවීම් මඟින් පිළිබිඹු වේ. නිදසුනකට ලිබරල්වාදය නමැති දෘෂ්ටිවාදයේ දහමට සම්බන්ධ විශ්වාස වන්නේ නිදහස් මාධ්‍ය හා මැතිවරණ වැනි දේ ය. දෘෂ්ටිවාදී පිළිවෙත/දෛනික හුරුපුරුදු ඉහත සඳහන් දහම අභ්‍යාන්තරීකරණය මඟින් පිළිබිඹු වේ. එමඟින් දෘෂ්ටිවාදය ස්වභාවික යමක් ලෙස සලකයි. නිදසුනකට වර්තමානයේ බොහෝ දෙනෙකුට ලිබරල්වාදය ස්වභාවික වී ඇත. එය අභ්‍යාන්තරීකරණය වී ඇත.

දෘෂ්ටිවාදය පිළිබඳ අදහස ඔහු හේගලියානු ත්‍රිත්වයක් වන ස්වාර්ථය (in-itself), පරාර්ථය (for-itself) හා ඖපපාතිකය (in-and-for-itself) සමඟ සම්බන්ධ කරයි. in-itself ඔහු සම්බන්ධ කරන්නේ දහම (doctrine) සමඟ ය. එය අදහස් හා සංකල්ප ආදියෙන් සමන්විත වී ඇත. for-itself යන්න ලුවී

අල්තුෂර් පෙන්වා දුන් දෘෂ්ටිවාදී රාජ්‍ය උපකරණ ඇසුරෙන් ඔහු පැහැදිලි කරයි. එනම්, කෙනෙකු පිළිවෙත් අනුයාම යනු අභ්‍යන්තර විශ්වාසය බාහිරින් ප්‍රකාශමාන වීමකි. in-and-for-itself යනුවෙන් අදහස් වන්නේ දෘෂ්ටිවාදය බාහිර ලෙස පෙනුණ ද එය පවත්වා ගැනීම සඳහා තමන්ගේ ම ආත්මීය දායකත්වය පවතින බව පෙන්වා දීම යි. මෙහි දී පරාර්ථ දෘෂ්ටිවාදය, ස්වාර්ථ දෘෂ්ටිවාදය තුළ ක්‍රියාකාරී වේ. ඒ අනුව දෘෂ්ටිවාදය පුද්ගල ක්‍රියා සමඟ සම්බන්ධ වේ. එහි දී ඔහු පෙන්වා දෙන්නේ යම් පිළිවෙතක් සමඟ කෙනෙකු යම් දුරක් නඩත්තු කරන විට ඔහු නො දන්නේ අභ්‍යන්තරික ව එම පිළිවෙත ඔහු මත ආධිපත්‍යය පතුරුවා ඇති බව ය.

දීප්ති කුමාර ගුණරත්න සහෝදරයාගේ මැදිහත්වීමට පෙර ශ්‍රී ලංකාව තුළ දෘෂ්ටිවාදය පිළිබඳ අදහස් සඳහා බලපා තිබුණේ මාක්සියානු අදහස් ය. මහාචාර්ය සුචරිත ගම්ලත්, මහාචාර්ය පියසීලි විජේගුණසිංහ, ගාමිණී විජේතුංග යන අයගේ ලේඛන පරිශීලනය කරන විට ඒ බව පැහැදිලි වේ. මහාචාර්ය සුචරිත ගම්ලත් අපට වැදගත් වන්නේ ශ්‍රී ලංකාව තුළ ideology යන පදය සඳහා භාවිතා වූ මතවාදය නමැති පදයට වඩා දෘෂ්ටිවාදය නමැති පදය යෝග්‍ය බව පෙන්වා දීම නිසා ය. නමුත් මහාචාර්ය ගම්ලත් දෘෂ්ටිවාදය පිළිබඳ පළ කර ඇති අදහස් අදාළ වන්නේ ඥානවිභාගයට ය. දීප්ති කුමාර ගුණරත්න සහෝදරයා ඊට පටහැනි ව සාධාරණ වාග්විද්‍යාවේ මූලධර්මවලට හා මනෝවිශ්ලේෂණයට අනුකූල වන සත්භාවවේදයක් ඒ සඳහා යෝජනා කරයි. මහාචාර්ය ගම්ලත් යථාර්ථය යනු සංගතභාවයක් ලෙස සලකන විට දීප්ති සහෝදරයා යථාර්ථයේ අසංගතභාවය පෙන්වා දෙයි.

‘‘විනෝදය‘‘ හා ‘‘ඇසිඩ් වැස්ස‘‘ ග්‍රන්ථ තුළ දීප්ති සහෝදරයා දෘෂ්ටිවාදය සංකල්පය පැහැදිලි කර ඇත. ‘‘ඇසිඩ් වැස්ස‘‘ ග්‍රන්ථයේ ඔහු අල්තුෂර් ගොඩනගන අදහස ලැකානියානු මනෝවිශ්ලේෂණය ආශ්‍රයෙන් පහත පරිදි පැහැදිලි කරයි.

‘‘එමගින් අල්තුෂර්ගේ දෘෂ්ටිවාදාත්මක ආත්මය යනු මහා අනෙකාගේ පිළිගැනීමට ලක් වන විවිධ අහමයන් මිස නියම ආත්මය නො වේ. දෘෂ්ටිවාදය විසින් පුද්ගලයා ආත්මයක් බවට පත් වන බව කියන විට ඉන් අදහස් වන්නේ ලැකාන් විග්‍රහ කරන ආත්මය නො ව අහම යි.‘‘ (25 පිටුව)

එම අදහස ඔහු විනෝදය නමැති මනෝවිශ්ලේෂණ සංකල්පය සමඟ සම්බන්ධ කරන්නේ පහත පරිදි ය.

‘‘මන්ද යත් සමකාලීන නූතන ධනවාදී දෘෂ්ටිවාදය තවදුරටත් විනෝදය ප්‍රකාශමාන ලෙස තහංචි දමන්නේ නැත. ඒ වෙනුවට දෘෂ්ටිවාදය විසින් විනෝදය සඳහා නියෝග ලබා දෙයි. එබැවින් සමකාලීන දෘෂ්ටිවාදය සංවාසය කරන්නේ සුපිරි අහම සමඟ මිස පොදු නීතිය සමඟ නො වේ.‘‘ (90 පිටුව)

එය වැඩිදුරටත් පහදමින් ඔහු සඳහන් කරන්නේ දෘෂ්ටිවාදය පිළිබඳ න්‍යාය ඉලක්ක ගත විය යුත්තේ අර්ථය වෙත නො ව විනෝදය වෙත බව ය. දෘෂ්ටිවාදය මිනිසුන් ව පාලනය කරනු ලබන්නේ අදහස් මඟින් නො ව ලුබ්ධි ම ය පගාව මඟිනි.

ස්ලැවෝ ජිජැක් 90 දශකයේ රචනා කරන ලද "The Sublime Object of Ideology" කෘතියේ සිට දෘෂ්ටිවාදී විශ්ලේෂණයේ (critique of ideology) යෙදුණ ද ඔහු පසුකාලීන ව රචනා කරන ලද "Less Than Nothing" කෘතියේ "Absolute" හෙවත් පරමත්වය, එසේත් නැත්නම් යථාර්ථය යනු වස්තුව සහ ආත්මය යන ආස්ථාන දෙකෙහි ම එකතුවක් නමැති හේගලියානු අදහසට එළඹෙන ආකාරය නිරීක්ෂණය කළ හැකි ය. එනම්, ඔහු එහි දී ඥානවිභාගයේ සිට සත්භාවවේදය දක්වා මාරු වේ. එහි දී යම් අයෙක් විශ්ලේෂණය කරන යථාර්ථය තුළ ම ඔහු ද සිටින බව ජිජැක් පෙන්වා දෙයි. එවිට දෘෂ්ටිවාදය විශ්ලේෂණයේ දී අප විවේචනය කළ යුත්තේ බාහිර බලවේග නො ව අප ම ය, තමා ව ම ය. දෘෂ්ටිවාදය විවේචනය කිරීම පිළිබඳ මෙම මාදිලිය අප හැර වෙනත් කිසිවෙකු ශ්‍රී ලංකාව තුළ භාවිතා කර නො මැත. තවමත් වාස්තවිකත්වය විවේචනය කරන ඔවුන්ට ඒ පිළිබඳ වැටහීමක් ද නො මැත. ඔවුන් අතින් විවේචනය වන්නේ ආත්මය බැහැර කර ඇති දෘෂ්ටිවාදයකි. ඔවුන්ට අනුව යථාර්ථය යනු අපට පූර්වයෙන් ම දෙනු ලබන බාහිර යමකි. එවිට, එය ආත්මය මත පටවන යමක් බවට පත් වේ. නමුත් ඊට පටහැනි ව අප වටහා ගත යුත්තේ යථාර්ථය ගොඩනැගීම සඳහා මාගේ ද දායකත්වයක් පවතින බව ය. එවිට විවේචනය කළ යුතු වන්නේ යථාර්ථය නො ව එම යථාර්ථය ගොඩනැංවීම සඳහා අප කර ඇති ආයෝජනය ය.